| | | |
|---|---|---|
| | Zahira College – Colombo<br>Holiday Assessment | |
| | Medium : English | Grade: 6E – 1st Language |
| | Subject : Sinhala language and literature | Date : 29.07.2015 |
| | Online assessment | Mrs G W J Dulanjalee |

1.ඔබ දන්නා ඒක වචන ක්‍රියා පද 10 ක් ලියන්න.
2.ඔබ දන්නා බහු වචන ක්‍රියා පද 10 ක් ලියන්න.
3.ඔබ දන්නා නිපාත පද 10 ක් ලියන්න.
4.ඔබ දන්නා විශේෂණ පද 10 ක් ලියන්න.
5. "න ණ ල ළ" යෙදෙන වචන 10 පාඩමෙන් සොයා ලියන්න. ඊට අදාල අකුර යටින් ඉරක් අඳින්න.

<u>වාක්‍ය රීති</u>

- උක්තය ප්‍රාණවාචී ඒක වචන නම් අවසාන ක්‍රියා ඒක වචන විය යුතුයි.
  උදා : **ගොවියා කුඹුර කොටයි.**
  මෙලෙස <u>වාක්‍ය</u> 05 ක් නිර්මාණය කරන්න.

- උක්තය ප්‍රාණවාචී බහු වචන නම් අවසාන ක්‍රියා බහු වචන විය යුතුයි.
  උදා : **ගොවියො කුඹුරු කොටති.**
  මෙලෙස <u>වාක්‍ය</u> 05 ක් නිර්මාණය කරන්න.

- උක්තය අප්‍රාණවාචී ඒක වචන වුවත් බහු වචන වුවත් නම් අවසාන ක්‍රියාව ඒක වචන විය යුතුයි.

  උදා : **ගස සුළඟට වැනෙයි.**
  **ගස් සුළඟට වැනෙයි.**
  මෙලෙස <u>වාක්‍ය</u> 05 ක් නිර්මාණය කරන්න.

- ඒ ඒ පුරුෂයට අනුව ආඛ්‍යාතය තැබිය යුතුයි.

  උත්තම පුරුෂ : **මම පාසැල් යමි.**
  **අපි පාසැල් යමු.**

  මධ ම පුරුෂ **තො පන්සල් යහි**
  **තො පි පන්සල් යහු.**

  **නුඹ පන්සල් යන්නෙහි**

**නුඹලා පන්සල් යන්නෙහු**
මෙලෙස <u>**වාක්‍ය**</u> 05 ක් නිර්මාණය කරන්න.

- ප්‍රථම පුරුෂයේදී උක්තයට අනුව ආඛ්‍යාතය තබන්න.
- ස්ත්‍රී ලිංග පදයක් උක්ත වන විට ආඛ්‍යාතය ස්ත්‍රී ලිංගයෙන් අවසන් විය යුතුයි.

උදා : වර්තමාන කාලය - **නංගී මල් කඩන්නාය/කඩයි**

උදා : අතීත කාලය - **නංගී මල් කැඩුවාය.**

මෙලෙස <u>**වාක්‍ය**</u> 05 ක් නිර්මාණය කරන්න.

- පුරුෂ ලිංග පදයක් උක්ත වන විට ආඛ්‍යාතය පුරුෂ ලිංගයෙන් අවසන් විය යුතුයි.

උදා : වර්තමාන කාලය - මල්ලි මල් කඩයි/ කඩන්නේය.

අතීත කාලය - මල්ලි මල් කැඩුවේය.

මෙලෙස <u>**වාක්‍ය**</u> 05 ක් නිර්මාණය කරන්න.

1.ඔබ කැමති පහත එක් මාතෘකාවක් යටතේ කවි දෙකක් නිර්මාණය කරන්න..

වැස්ස
අම්මා
උදෑසන අසිරිය
නිල් අහස
මුහුද

2. සිරිත් මල් දම පාඩමේ ඇති හොඳ සිරිත් 05 ක් නම් කරන්න.

3. එය රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද?

4.ඔබ කැමති පහත එක් මාතෘකාවක් යටතේ වචන 150 රචනයක් ලියන්න.

- වැව හා බැඳුණු අපේ සංස්කෘතිය.
- පරිසරය සුරකිමු.
- වන සම්පත රැක ගනිමු.
- ගැල් කරුවකු ගේ ජීවිතය.
- අපි සාරධර්ම රැක ගනිමු.

5. පාසැලේ විභාගය ආවසන් වී ඔබ ගමෙ එන බව දන්වමින් ආච්චි අම්මාට ලිපියක් ලියන්න.
6. ලෝක ගුරු දිනය වෙනුවෙන් ඔබේ ගුරුතමියට සුබ පතා සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.